# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 07.
**Tel:** 011 5654448, 011 5654449,011 2564404 **Fax:** 011 4722632
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

## තෙවන මාධ්‍ය නිවේදනය

## 2008 අගෝස්තු මස 21 වන දින දිය

එළඹෙන උතුරු මැද හා සබරගමු පළාත් සභා මැතිවරණය තුල පූර්ව මැතිවරණ සමයේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා 218ක් 2008.8.20 වන විට වාර්තා වී ඇත. මෙම පැමිණිලි වලින් 104ක් බරපතල සිදුවීම් වන අතර පැමිණිලි 114ක් සුළු සිදුවීම් වේ. පැමිණිලි 118ක් උතුරුමැද පළාතෙන් හා 100 ක් සබරගමු පළාතෙන් වාර්තා වේ.

උතුරු මැදින් වාර්තා වන පැමිණිලි 118න් 86ක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් හා පැමිණිලි 32 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ද වන අතර සබරගමුවෙන් වාර්තා වන පැමිණි 104 න් 56 ක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් හා පැමිණිල්ලි 44 ක් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ද වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මුළු පැමිණිලි 86න් 37 ක් බරපතල සිදුවීම් වලට අදාලවන අතර පැමිණිලි 49 ක් සුළු සිදුවීම් වලට අදාල වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වන මුළු පැමිණිලි 32 න් පැමිණිලි 18 ක් බරපතල සිදුවීම් වන අතර 14 ක් සුළු සිදුවීම් වේ. රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන පැමිණි 56 න් 27 ක් බරපතල සිදුවීම් ද 29 ක් සුළු සිදුවීම්ද වේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ මුළු පැමිණිලි 44 න් 22 ක් බරපතල සිදුවීම් වන අතර සුළු සිදුවීම් ද 22 කි.

වාර්තා වී ඇති මුළු පැමිණිලි 218 න් එ.ජ.නි.ස. ය පැමිණිලි 115 කට වුදිතයන් වන අතර එ.ජා.ප. ය පැමිණිලි 35 කට ද, ජ.වි.පෙ. පැමිණිලි 4 කට ද ජාතික කොංග්‍රසය පැමිණිලි 1 කටද, පොලිසිය පැමිණිලි 2 කට ද, දේශපාලන පක්ෂ සඳහන් නොවූ පුද්ගල කණ්ඩායම් පැමිණිලි 61 කට ද චූදිතයන් වී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ එ.ජා.නි.ස. ය

**TOTAL NUMBER OF INCEDENTS BY TYPE (218)**




INCIDENT BY DISTRICT




**TOTAL NUMBER OF INCIDENTS BY DISTRICT**




POLONNARUWA




ANURADAPURA




RATNAPURA




KEGALLE

චූදිතයන් වන පැමිණිලි 34 න් බර්ට් ප්‍රේමලාල් දිසානායක (ප්‍රධාන ඇමති අපේක්ෂක එ.ජා.නි.ස.) ගේ ආධාර කරුවන් පැමිණිලි 4කට වගඋත්තරකරුවන් වන අතර එස්. එම්. රංජිත් (අපේක්ෂක එ.ජා.නි.ස) ගේ ආධාර කරුවන් පැමිණිලි 1 කට වගඋත්තරකරුවන් ලෙස නම් කොට ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එ.ජා.නි.ස. ය චූදිතයන් වන පැමිණිලි 18 න් එස්.එම් ජයන්ත, ආදම් ලෙබ්බේ ෆායිස් හා ඩී.එස්. දයාවංශ යන එ.ජ.නි.ස. අපේක්ෂයන්ගේ ආධාර කරුවන් පැමිණිලි 1 කට බැගින් ද වගඋත්තර කරුවන් වී ඇත. එම දිස්ත්‍රික්කයේම එ.ජා.ප. ය චූදිතයන් වන පැමිණිලි 7 න් අනුර සිඩ්නි ජයරත්න (එ.ජා.ප. අපේක්ෂක) සෘජුවම සිද්ධි 1 කට වගඋත්තරකරු වී ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස. යට එරෙහිව ඇති පැමිණිලි 30 න් ග්‍රාමීය කර්මාන්ත අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර ගේ ආධාර කරුවන් පැමිණිලි 4 කට වගඋත්තර කරුවන් වී ඇති අතර කාංචන ජයරත්න (එ.ජ.නි.ස. අපේක්ෂක) ගේ ආධාර කරුවන් පැමිණිලි 4 කට ද, රංජිත් සොයිසා (එ.ජ.නි.ස. අපේක්ෂක) ගේ ආධාර කරුවන් පැමිණිලි 3 කට ද වගඋත්තර කරුවන් වී ඇත. ප්‍රේමලාල් ජයසේකර සෘජුවම එක් පැමිණිල්ලකට වගඋත්තරකරු වී ඇත. එම දිස්ත්‍රික්කයේම එ.ජා.ප. යට එරෙහිව ඇති පැමිණිලි 11 යින් හසිත සමන්ත (එ.ජා.ප. අපේක්ෂක)ගේ ආධාර කරුවන් සිදුවීම් එකකට වගඋත්තර කරුවන් වී ඇත.

කෑගල්ල දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස. ය චූදිතයන් වන පැමිණිලි 33 න් මහීපාල හේරත් ප්‍රධාන අමාත්‍ය අපේක්ෂක එ.ජ.නි.ස. ගේ ආධාර කරුවන් පැමිණිලි 7 කට චූදිතයන් වන අතර එම පක්ෂයේම අපේක්ෂකයන් වන ඉම්තියාස් කාදර් ගේ ආධාර කරුවන් පැමිණිලි 3 කට ද සමන් ජයසිංහගේ ආධාර කරුවන් පැමිණිලි 2 කට ද වග උත්තර කරුවන් ඇත.




මේ දක්වා වාර්තා වී ඇති පැමිණිලි වලින් එ.ජ.නි.ස. යට විරුද්ධව එ.ජ.නි.ස. යෙන් ම පැමිණිලි 3 ක් ඉදිරිපත් කර ඇති අතර එම දේශපාලන පක්ෂයට විරුද්ධව එ.ජා.ප.ය පැමිණිලි 46 ක් ද, ජ.වි.පෙ. පැමිණිලි 52 ක් ද රුහුණු ජනතා පක්ෂය (RJP) පැමිණිලි 4 ක් ද කම්කරු කොංග්‍රසය පැමිණිලි 2ක් ද, පොලිසිය පැමිණිලි 1 ක් ද, CMEV ය පැමිණිලි 5 ක් හා දේශපාලන පක්ෂ නොවූ පුද්ගලයන් හෝ කණ්ඩායම් පැමිණිලි 2 ක් ද ඉදිරිපත් කර ඇත. එ.ජා.ප.ය. ට විරුද්ධව එ.ජ.නි.ස.ය පැමිණිලි 30 ඉදිරිපත් කර අතර ජ.වි.පෙ. පැමිණිලි 4ක් හා කම්කරු කොංග්‍රසය (CWC) පැමිණිලි 1ක් ද වශයෙන් ඉදිපත් කර ඇත.

ජ.වි.පෙ. ට විරුද්ධව එ.ජ.නි.ස.ය පැමිණිලි 4ක් ඉදිරිපත් කර ඇත.

මීට අමතරව ප්‍රධාන දේශපාළන පක්ෂ 3 එනම් එ.ජ.නි.ස., එ.ජා.ප., ජ.වි.පෙ. ඔවුන් විසින් ඉදිපත් කර ඇති බරපතල සිදුවීම් වලට ට අදාල පැමිණිලි පහත සඳහන් ආකාරයට ඉදිරිපත් කර ඇත.

| Incidents Parties | Attempted murder | Grievous hurt | Hurt | Assault | Threat & intimidation | Misuse of State Resources | Robbery | Arson | Abduction |
|---|---|---|---|---|---|---|---|---|---|
| UPFA | | 1 | 3 | 12 | 5 | | 3 | 5 | |
| UNP | 2 | | 7 | 13 | 6 | | 3 | 4 | 1 |
| JVP | 1 | | 2 | 13 | 9 | 2 | 3 | 1 | |

**ගිණි අවි භාවිතය**

වාර්තා වී ඇති  සම්පූර්ණ සිදුවීම් සංඛ්‍යාවෙන් සිදුවීම් 16 ක් සඳහා ගිණි අවි භාවිත කර අතර එය මුළු සිදුවීම් වලින් 10.5%  කි මෙම තත්වය සැලකිය යුතු අගයක් බව CMEV ය විශ්වාස කරයි. ඊට අදාලව ලැබී ඇති පැමිණිලිවලින් එ.ජ.නි.ස ය පැමිණිලි 8 කටද, එ.ජා.ප.ය පැමිණිලි 2 කටද, ඉතිරි යට හඳුනා නොගත් කණ්ඩායම් හා පුද්ගලයන් ද වගකිව යුතුව ඇත.

**රජයේ දේපල මැතිවරණය සඳහා භාවිත කිරීම**

CMEV ට වාර්තා වී ඇති මුළු පැමිණිලි 218 න් රජයේ දේපල / සම්පත් (පළාත් සභාවට අයත් වාහන, අනුරාධපුර ප්‍රධාන අමාත්‍ය කාර්යාලය හා එහි සම්පත්) භාවිත කිරීමට අදාල පැමිණිලි 8 ක් ලැබී ඇති අතර එය එ.ජ.නි.ස. යට එරෙහිව පමණක් වාර්තා වී ඇත.

**තාවකාලික හැඳුනුම් පත් නිකුත් කිරීම**

මැතිවරණයේ දී අනන්‍යතාවය සහතික කිරීමට අදාලව මැතිවරණ කොමසාරිස් වරයා ගනුලැබූ පියවර විශේෂයෙන්ම හොර ඡන්ද දැමීම වැලක් වීමට අදාලව ගත හැකි සාධනීය පියවරක් බව CMEV  ය විශ්වාස කරයි. නමුත් එළඹෙන මැතිවරණය තුල ඡන්ද දායකයන් සියළුම දෙනා වෙත  මැතිවරණයට පෙරාතුව අනන්‍යතාවය සහතික කිරීමට අදාලව යොදා ගතහැකි ක්‍රියාදාමය 100%    සාර්ථක වී නැති බව CMEV යට වාර්තා වී ඇත.

තෝරාගත් නියදියක් ලෙස අනුරාධපු දිස්ත්‍රික්කයේ හොරෝව්පතාන හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද යන ප්‍රදේශයේ කේන්ද්‍ර ගතව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය කරනු ලැබූ නිරීක්ෂණ වලින් පහත කරුණු අනාවරනය විය.

වැලිකන්ද මොනරතැන්න ග්‍රාමයේදී මේ ගැන විමසීමේ දී අනාවරනය වූ යේ එම ග්‍රාමයේ සැලකිය යුතු ඡන්ද දායකයින් පිරිසකට තවමත් හැඳුනුම් පත් හෝ සහතික කල අනන්‍යතාවය පත්‍රයක් ලබාගැනීමට හැකි වී නැති බවයි. එම තත්වය තුල සමහර අපේක්ෂකයින් ඔවුන්ගේ පෞද්ගලික වීදමින් පුද්ගලයින්ට ඡායාරූප ලබා දීමට කටයුතු කරඇති බව CMEV යට වාර්තා වී ඇත.

මේ පිළිබඳ CMEV යට සහකාර මැතිවරණ කොමසාරිස් පොළොන්නරුව W.H.R. විජේකුමාර මහතා ගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කළේ මැතිවරණ කොමිසාරිස්ගේ දැනුම් දීම් මත තාවකාලික අනන්‍යතා පත්‍ර නිකුත්කිරීමට අදාලව වැඩ පිළිවෙලක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ බවත් ඉන් 8000 කට ආසන්න පිරිසකට අනන්‍යතා පත්‍ර ලබා ගැනීමට කටයුතු කළ බවත් ය. එය අද (2008.8.20.) දින දක්වා ක්‍රියාත්මක බව ඔහු ප්‍රකාශකරන ලදි නමුත් මෙම ව්‍යපෘතිය හරහා කීදෙනෙකුට අනන්‍යතා පත්‍ර ලබා ගැනීමට නොහැකි වූවද සංඛ්‍යා ලේඛන ඔවුන් සතුව නැතිබව ප්‍රකාශ කරන ලදි.

**පොලිසිය පක්ෂපාති ක්‍රියාකාරීත්වය**

පූර්ව මැතිවරණ කාල පරිච්ඡේදය තුල මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අවම කර ගැනීමට අදාලව හා මැතිවරණ දින නිදහස් හා සාමකාමි මැතිවරණයක් පැවැත්වීමට අදාලව පොලිසියේ පක්ෂ පාති ක්‍රියාකාරිත්වය මැතිවරණ පැවැත්වන සමහරු ප්‍රදේශවල තීරනාත්මක කාරණයක් බව CMEVයේ විශ්වාසයයි.

විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාලව මේ ප්‍රධාන කාර්යක් වන අතර පවතින තත්වය මත 2008.8.13 දින ප්‍රධාන මහෝස්ත්‍රාත් හා දිසා විනිසුරු රුචිර වැලිවත්ත මහතා කල ප්‍රකාශයෙන් එනම් "නගරේ ප්‍රචණ්ඩ ක්‍රියා උත්සන්න වීමට ප්‍රධාන හේතුව පොලිසියේ අකාර්යක්ෂමතාවයයි" මේ මනාව තහවුරු වේ. එතුමා මෙම අදහස ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ඉකුත් 8 අළුයම අනුරාධපුර මහජන පොළ අසලදී දේශපාලන මැර පිරිසක් විසින් UNP  ආදාර කරුවන් පිරිසකට වෙඩි තබා පුද්ගලයකුට තුවාල සිදු කිරීමේ සිද්ධිය පිළිබඳව පොලිසිය අධිකරණයට කරුණු ඉදිරිපත් කර අවස්ථාවේදීය.

අමතරව මෙම තත්වය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව මැතිවරණ බල ප්‍රදේශය තුලත් කෑගල්ල දිස්ත්‍රික්කය රඹුක්කන කෑගල්ල මැතිවරණ බලප්‍රදේශයන් තුලත් තීරණාත්මක

කාරනයක් වන අතර සමහර දේශපාලන පක්ෂය මේ පිළිබඳ මේවන විටත් මැතිවරණ කොමසාරිස් වරයා මෙන්ම පොලිස්පති වරයාටද ලිඛිතව කරුනු ඉදිරිපත් කර ඇත.

**සමස්ථ නිරීක්ෂණ සම්පිණ්ඩනය – පූර්ව මැතිවරණ සමය**

එළඹෙන මැතිවරණයට අදාලව පූර්ව මැතිවරණ සමයේ මැතිවරණ සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා ඉහලයාමට අදාලව.

1. ප්‍රධාන දේශපාළන පක්ෂ 2 එනම් එක්සත් ජනතා නිදහස් සන්ධානය හා එක්සත් ජාතික පක්ෂය හි ක්‍රියා කලාපය එනම් මැතිවරණයට අදාල ප්‍රචාරක නීති රීතිවලට ගරු නොකිරීම.

2. මැතිවරණය පැවැත්වන දිස්ත්‍රික්ක 4 හි සමහර ප්‍රදේශවල පොලිසිවල දැඩි පක්ෂ පාති ක්‍රියාකාරිත්වය.

3. අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේහි මහ ඇමති අපේක්ෂකත්වයට අදාලව මනාප ලබා ගැනීමේ තරඟ කාරීත්වය.

4. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව මැතිවරණ කොට්ඨාශයේ (TMVP හි ක්‍රියාකාරිත්වය

5. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව මැතිවරණ කොට්ඨාශයේ UPFA මගින් JVP ට එරෙහිව කරන ලද බලපෑම.

6. කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, කෑගල්ල හා මාවනැල්ල මැතිවරණ කොට්ඨාශවල හිටපු මහා ඇමති මහීපාල හේරත්ගේ හා ඔහුගේ ආධාර කරුවන්ගේ ප්‍රචණ්ඩ හැසිරීම.

පූර්ව මැතිවරණ සමයේ සිදු වූ මැතිවරණ ආශ්‍රයෙන් සිදුවුණු ප්‍රචණ්ඩ ක්‍රියාවලට මූලික වූ හේතු සාධක බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විශ්වාස කරයි.